Class	371.904
No	D22

"ශ්‍රී ලංකාවේ ප්‍රාථමික පාසල් සිසුන් විසින් අත් කර ගත යුතු අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සහ එම නිපුණතාවල ප්‍රවීණතා මට්ටමට පැමිණීමට අසමත් වූ සිසුන්ට අවශ්‍ය මැදිහත්වීම් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්."

"An Investigation into Essential Learning Competencies to be acquired by Sri Lankan Primary School Students and the Interventions Needed to Students who fail to achieve them."

දෙදිවලගේ දෝන් ඉනෝකා දීප්තිණී දෙදිවල

අධ්‍යාපන දර්ශනශූරී උපාධි පරීක්ෂණය සඳහා
ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධය

OPEN UNIVERSITY
74512

අධ්‍යාපන පීඨය
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකාව.

2020 පෙබරවාරි

සංක්ෂිප්තය

විධිමත් අධ්‍යාපනයට ආධාර කිරීම මූලික පරමාර්ථය කරගෙන ප්‍රාථමික අධ්‍යාපනය සැලසුම් කර ඇති අතර එය විවිධ වූ වැඩසටහන් අන්තර්ගත ව සංවිධානය වී ඇත. ප්‍රාථමික අධ්‍යාපන කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක වන "**අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා**" (ELC) වැඩසටහන 1997 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සමඟ ප්‍රාථමික අධ්‍යාපන ක්‍රියාවලියට එකතු වූ වැදගත් හා සුවිශේෂී අංගයකි. මෙම අධ්‍යයනය එම "අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා" වැඩසටහන මුල් කර ගෙන සිදු කරන ලදී. සෑම ශිෂ්‍යයෙක් ම අවශ්‍ය අවම ප්‍රවීණතා මට්ටමටවත් ගෙන ඒම අරමුණු කරගෙන ප්‍රාථමික අධ්‍යාපන අවධිය සඳහා "අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා" වැඩසටහන 1999 වර්ෂයේ සිට සමස්ත ශ්‍රී ලංකාව පුරාම ක්‍රියාත්මක කරන ලදී. 2019 වන විට දී ද ක්‍රියාත්මක වන එම වැඩසටහන මඟින් ප්‍රාථමික අධ්‍යාපනයේ එක් එක් ප්‍රධාන අවධිවල දී, විශේෂ අධ්‍යාපන අවශ්‍යතා නොමැති සිසුන් විසින් ප්‍රවීණතාවට අත්‍යවශ්‍යයෙන් ම පැමිණිය යුතු නිපුණතා සමූහයක් "අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා" ලෙස හඳුනාගෙන ඇත. ඇමරිකා එක්සත් ජනපදයේ NCLB අධ්‍යාපන පනත (2001) සහ 1986 දී ඉන්දියාවේ හඳුන්වා දුන් අවම ඉගෙනුම් මට්ටම (MLL) යන වැඩසටහන් මෙම වැඩසටහන හා සමානකමක් දක්වනු ලැබේ. එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් පසුව ද වර්ෂ 2003 සහ 2007 වන විටත් ශිෂ්‍ය ප්‍රවීණතාව අපේක්ෂිත අවම මට්ටමටවත් පැමිණ නැති බව අනාවරණය කරගෙන ඇත (NEREC, 2003 හා 2007). ඉහත සඳහන් සියලු තත්ත්ව පිළිබඳ අවධානය යොමු කර මෙම අධ්‍යයනය "ශ්‍රී ලංකාවේ ප්‍රාථමික පාසල් සිසුන් විසින් අත් කර ගත යුතු අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා (ELC) සහ එම නිපුණතාවල ප්‍රවීණතා මට්ටමට පැමිණීමට අසමත් වූ සිසුන්ට අවශ්‍ය මැදිහත්වීම් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්." ලෙස සිදු කරන ලදී.

දෙවන ප්‍රධාන අවධිය සඳහා හඳුනාගෙන ඇති අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාවල යෝග්‍යතාව, එම නිපුණතාවල ශිෂ්‍ය ප්‍රවීණතාව, ප්‍රවීණතාවට බලපාන ශිෂ්‍යයා, පාසල සහ නිවස සම්බන්ධ හිතකර හා අහිතකර තත්ත්ව හඳුනාගැනීම සහ එම නිපුණතාවල ප්‍රවීණතා මට්ටමට නොපැමිණි සිසුන් ප්‍රවීණතා මට්ටමට ගෙන ඒම සඳහා මැදිහත්වීම් ක්‍රියාවලියක් සිදුකර යෝග්‍ය මැදිහත්වීම් ක්‍රමවේදයක් තුළින් මැදිහත්වීම් ආකෘතියක් (Intervention Model) හඳුනාගැනීම යන අරමුණු මෙම අධ්‍යයනය මඟින් ඉටු කර ගන්නා ලදී. අධ්‍යයනය

සඳහා මිශ්‍ර පර්යේෂණ ප්‍රවේශය යොදා ගත් අතර සිසුන් 240 ක හා ගුරුවරු 96 ක නියැදියක් සමස්ත දිස්ත්‍රික්කය ම, අධ්‍යාපන කලාප 3 ම, හා 1 AB, 1C, Type 2 හා Type 3 යන පාසල් වර්ග 4 ම නියෝජනය වන ලෙස තෝරා ගන්නා ලදී. ප්‍රාථමික අධ්‍යාපන සැලසුම් මට්ටමේ නිලධාරීන් 6 දෙනෙකු ද නියැදීමේ සහේතුක ක්‍රමයට තෝරා ගන්නා ලදී. දත්ත රැස්කිරීමට නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි, ප්‍රතිචාර දැක්වීමේ ලේඛන හා ලේඛන සමීක්ෂණය යොදා ගන්නා ලදී. සිසුන්ගේ අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාවල ප්‍රවීණතාව හඳුනාගැනීම සඳහා පර්යේෂකයා විසින් ප්‍රායෝගික ව නිපුණතාවල ප්‍රවීණතාව විමසන ලදී. රැස් කරන ලද දත්ත ප්‍රමාණාත්මක ව හා ගුණාත්මක ව විශ්ලේෂණය කරන ලදී.

නම් කරන ලද අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාවලින් වැඩි ප්‍රමාණයක් යෝග්‍ය බව නිගමනය විය. එම නිපුණතා 10ක් පමණ නිපුණතා ඇති කිරීමේ, මැනීමේ, මැතීමේ නිර්ණායකවල ගැටලු සහ සිසුන්ගේ මට්ටමට වඩා පහළ යන කරුණු නිසා යෝග්‍ය නොවන බවට ද හඳුනාගන්නා ලදී. එම යෝග්‍ය නොවන නිපුණතා පිළිබඳ ව විශේෂිත අවධානය යොමු කළ යුතු බව නිගමනය විය. අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා හඳුනාගැනීමට යෝග්‍ය ක්‍රමවේදයක් භාවිත කර ඇති නමුත් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා හඳුනාගැනීමේ දී ළමයින්ගේ සංවර්ධන අවශ්‍යතා ඉටු වීම පිළිබඳ ව අවධානය ප්‍රමාණවත් නොවන බව නිගමනය විය. අපේක්ෂිත අවම ප්‍රවීණතා මට්ටමට සිසුන් සියලු දෙනාම පැමිණිය යුතු වුවත් එසේ පැමිණ නැති බව ගුරුවරයාගේ හා පර්යේෂකයාගේ වාර්තා දෙකට ම අනුව නිගමනය විය. ඒ අනුව අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා වැඩසටහනෙහි මූලික අරමුණ වෙත තවම ළඟා වී නැති බව නිගමනය කළ හැකිය. එසේ ම පර්යේෂකයාගේ හා ගුරුවරයාගේ වාර්තා දෙක අතර ශිෂ්‍ය ප්‍රවීණතාව පිළිබඳ දැඩි පරස්පරයක් පවතින බව අවස්ථා තුනක දී ම අනාවරණය විය. මඩිබස සම්බන්ධයෙන් සෑම නිපුණතාවක ම අපේක්ෂිත ප්‍රවීණතාව නොවන බව පර්යේෂකයාගේ හා ගුරුවරයාගේ අනාවරණ අනුව නිගමනය විය. ගණිතයට අදාළ එකතු කිරීම, අඩු කිරීම, වැඩි කිරීම, බෙදීම යන ප්‍රධාන ගණිත කර්ම හතර සම්බන්ධයෙන් ම ශිෂ්‍ය ප්‍රවීණතාව පහළ බව අනාවරණය විය. ගුරුවරයාට අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා වැඩසටහන පිළිබඳ ව සහ නිපුණතා මැනීමේ හා ඇති කිරීමේ නිර්ණායක පිළිබඳ ව නිවැරදි අවබෝධයක් පවතින්නේ නම් ශිෂ්‍ය දුර්වලතා නිවැරදි ව හඳුනාගෙන විධිමත් ව සැලසුම් කරන ලද මැදිහත්වීම් ක්‍රියාවලියක් තුළින් අපේක්ෂිත

ප්‍රවීණතා මට්ටමට සාමාන්‍ය පන්තියක ඉගෙනුම් ලබන සියලු ම සිසුන් පත් කළ හැකි බව අනාවරණය විය. නිපුණතාවල ශිෂ්‍ය ප්‍රවීණතාවට පාසලේ විදුහල්පති භූමිකාව ද, ගුරු වෘත්තීය කුසලතා ද, දෙමාපිය සමාජ, ආර්ථික, අධ්‍යාපනික මට්ටම් ද බලපාන බව මෙම අධ්‍යයනයේ අනාවරණ අනුව නිගමනය විය.

අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා මට්ටමට නොපැමිණි සිසුන් සඳහා ශ්‍රේණිය, විෂයය භේදයකින් තොර ව ඕනෑම ගුරුවරයෙකුට භාවිත කළ හැකි මැදිහත්වීම් ක්‍රමවේදයක් සමඟ මැදිහත්වීම් ආකෘතියක් මතුකර ගැනීමට අධ්‍යයනය තුළින් හැකි විය. එම මැදිහත්වීම් ආකෘතිය ශිෂ්‍ය ප්‍රවීණතාව ඉහළ නැංවීමට පාසල් මට්ටමෙන් භාවිත කිරීමට සහ සිසුන් ප්‍රවීණතාවට ගෙන ඒම සම්බන්ධ ඉදිරි පර්යේෂණ සඳහා භාවිත කිරීමට යෝජනා කරන අතර, සෑම ප්‍රාථමික පාසලකට ම විශේෂ අධ්‍යාපන ඒකකය නොවන ප්‍රතිකාර්ය අධ්‍යාපන ඒකකයක් පවත්වාගෙන යාමට මෙම අධ්‍යයනයේ අනාවරණ අනුව යෝජනා කර ඇත.

ABSTRACT

The study was based on the "Essential Learning Competency" (ELC) programme which is a very important component in the Primary Education phase. The Essential Learning Competency Programme for Elementary Education has been implemented throughout Sri Lanka since 1999 with the objective of bringing every student at least to the minimum performance level required. The program, which runs through 2019, has identified "Essential Learning Competencies" as a set of competencies that each student with no special education needs to master at each of the key stages of Primary Education. This programme is similar to the both programmes "Minimum Learning Levels", MLL (1986) in India and the "No Child Left Behind", NCLB Education Act (2001) introduced by Amarica. Even after the implementation of the ELC programme in Sri Lanka, it was revealed that student proficiency had not reached the expected level by year 2003 and 2007. (NEREC, 2003 & 2007). This study is an "Investigation into the Essential Learning Competencies to be acquired by Sri Lankan Primary School Students and the Interventions Needed to Students who fail to achieve them."

To identify the appropriateness of the Essential Learning Competencies identified for the Key Stage 2, the student's achievement in those competencies, the positive and negative factors related to the student, school and home that have an impact on student achievement and identify a suitable intervention process by implementing an intervening process for the students who have not reached the desired achievement level were the accomplished objectives of this study. Mixed research approach was employed in the study. Purposive Sampling Method was used to select the sample. The sample was consisted of 240 students and 96 teachers. Also it represented the entire district, all three Education Zones and all four school types: 1AB, 1C, 2 and 3, and six officials of Primary Education planning level. Data collection was done through Observations, Interviews, Questionnaires, Rating Scales and Documentary Surveys. The researcher herself involved in identifying the achievement of Essential Learning Competencies. The collected data was analyzed quantitatively and qualitatively.

It was concluded that 80% of the Essential Learning Competencies are appropriate and 20% of the competencies are inappropriate due to the problems related to imparting, measuring, problems related to measuring criteria and due to the reason that some of them are below and some are above to the standard levels appropriate to Key Stage Two. The inappropriateness of the 20% of competencies is an area that needs special attention. It was concluded that the methods used to identify the Essential

Learning Competencies were appropriate. Even though it is expected that 100% of students should reach the expected minimum proficiency level in all Essential Learning Competencies, the findings of teachers' and the researcher's revealed it is not. Also, it was concluded that there are vast discrepancies in between those two reports of the teachers' and the researcher's about student proficiency. In relation to 'Mother tongue' none of the students have reached the expected proficiency level in all competencies. It was revealed that attainment of proficiency in basic mathematics skills: additions, subtractions, multiplication and divisions is also low.

It was revealed that if the teachers have a correct understanding of the Essential Learning Competency Programme and the criteria for measuring and methodology of developing the competencies, it is possible to correctly identify the weaknesses in students. Then through a well-planned intervention programmes it is possible to help the students to attain the expected proficiency level in Essential Learning Competencies. It was revealed that the role of the school principal, professional skills of the teacher, socio-economic background and educational level of the parents can have an impact on the student's achievement in competencies.

At the end of this study the researcher has introduced an Intervention Model that can be used by a teacher to intervene the students' learning process to help them to reach the expected proficiency level irrespective of the grade of studying and the subject. The researcher recommended that the introduced Model should be implemented at school level to maximize the proficiency of students. Also the recommendation have been made for further research on enriching student proficiency. Further, researcher has proposed to establish a special unit to conduct remedial programmes for underachieving students who do not belong to the group of children with special needs.